**නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා - 2022**

---

**1. විගණන මතය**

1.1 නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 20 ක 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන, මුදල් ප්‍රවාහ ප්‍රකාශ සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 20 කට අදාළව විගණන වාර්තා නිකුත් කර තිබුණු අතර එම වාර්තාවල කාරක සභා 18 කට තත්ත්වාගණනය කල මතයක් ප්‍රකාශ කර ඇති අතර, අනෙක් කාරක සභා දෙක සඳහා අහිතකර මතයක් හා මතය ව්‍යාවනය කිරීමක් සිදු කර ඇත. ඒ සඳහා හේතුවී තිබුණු ප්‍රමාණාත්මක දෝෂයන් පහත දැක්වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන**

**1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ඇතුළත්ව ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල නොවීම**

| | **විගණන නිරීක්ෂණ** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 08 ක මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව. | ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කල යුතුය. |
| (ආ) | 2000 ජූනි 06 දිනැති අංක 518/2000 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛය අනුව කාරක සභා 20 හි ගොවිජන බැංකුවේ මූල්‍ය ප්‍රකාශන ගොවිජන සේවා කාරක සභාවේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඒකාබද්ධ කර නොතිබුණි. | අදාල උපදෙස් ගොවිජන සේවා දිස්ත්‍රික් කාර්යාලයෙන් ලබාදී නොතිබුණු බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කල යුතුය. |

**1.3.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | **විගණන නිරීක්ෂණ** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගොවිජන සේවා කාරක සභා දෙකක රු.99,914 ක බිත්තර වී තොගයක්, රිකිල්ලගස්කඩ ගොවිජන සේවා කාරක සභාවේ රු.7,738,650 ක යූරියා පොහොර තොගයක් හා පල්ලේබෝවල ගොවිජන සේවා කාරක සභාවේ ගොවිජන බැංකු ණය රු.200,000 ක් ගිණුම්ගත කර නොතිබුණි. | 2023 ගිණුම් වාර්තා මඟින් නිවැරදි කරන බව. | සියළු තොග හා ණය මුදල් ගිණුම්ගත කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | නුවරඑළිය ගොවිජන සේවා කාරක සභාවේ එකතුව රු.558,800 ක ගොඩනැඟිලි හා සේප්පුව සහ මුංවත්ත ගොවිජන සේවා කාරක සභාවේ භෞතිකව හඳුනාගත නොහැකි රු.127,712 ක ට්‍රැක්ටර් රථයක් ජංගම වගකීම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | කමිටුවක් පත් කර ශේෂ නිරවුල් කරන අතර, 2023 වර්ෂයේ ගිණුම් වාර්තාවල නිවැරදි කරන බව. | ගිණුම් ශේෂ නිවැරදි කල යුතුය. |
| (ඇ) | රාගල ගොවිජන සේවා කාරක සභාවේ හෙළ බොජුන්හල ඉදිකිරීමට වැයකල මුදල් රු.199,250 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි | 2023 වර්ෂයේ ගිණුම් වාර්තා මඟින් නිවැරදි කරන බව. | ගිණුම් ශේෂ නිවැරදි කල යුතුය. |
| (ඇ) | පල්ලේබෝවල ගොවිජන සේවා කාරක සභාවේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.214,580 ක ශේෂයක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දෙවරක් සටහන් කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව | නිවැරදි වටිනාකම් ගිණුම්ගත කල යුතුය. |

**1.3.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීමව | නිර්දේශය |
|---|---|---|
| රාගල ගොවිජන සේවා කාරක සභාවේ ස්ථාවර වත්කම් උප ලේඛනය අනුව වර්ෂ අවසාන ශුද්ධ අගය රු.4,004,728 ක් වුවද, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ එය රු.4,424,734 ක් ලෙස දක්වා තිබුණු බැවින්, රු.420,007 ක වෙනසක් නිරීක්ෂණය විය. | නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව. | නිවැරදි අගයන් ගිණුම්ගත කල යුතුය. |

**1.3.4 අවිනිශ්චිත ගිණුම්**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 03 ක 1996 - 1999 කාලපරිච්ඡේදයේ සිට පැවත එන එකතුව රු.557,061 ක ශේෂ නිරවුල් කර නොතිබුණි. | දීර්ඝ කාලයක සිට පැවත එන ශේෂ බැවින් නිරවුල් කිරීම සඳහා විස්තර සොයා ගත නොහැකි බව. | අවිනිශ්චිත ගිණුම් ශේෂ හඳුනාගෙන නිරවුල් කල යුතුය. |

**1.3.5 විගණන සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීමව | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 19 ක සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති එකතුව රු.25,091,217 ක වත්කම් ශේෂ 155 ක හා එකතුව රු.18,738,264 ක වගකීම් ශේෂ 98 ක අදාල උප ලේඛන, ශේෂ සනාථ කිරීම්, කාල විශ්ලේෂණ, බැංකු පාස්පොත් ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | මෙම ශේෂය පෙර සිට ඉදිරියට එන ශේෂයක් වන අතර, ඒ සඳහා අවශ්‍ය උපදෙස් ලබාගෙන නිවැරදි කිරීමට කටයුතු කරන බව | වත්කම් හා වගකීම් සනාථ කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් කල යුතුය. |

**1.4 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති,රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය | ගොවිජන සේවා කාරක සභා 20 ක වාර්ෂික කාර්යසාධන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | පනතේ විධිවිධාන අනුව කටයුතු කල යුතුය. |
| (ආ) | 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 53 (4) (අ) වගන්තිය | සෑම අවුරුදු 03 කට වරක් ඉඩම් හිමි නාම ලේඛන ප්‍රතිශෝධනය කර ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්වරයා විසින් පරීක්ෂා කර සහතික කළයුතු වුවත් ගොවිජන සේවා කාරක සභා 02 ක් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව | පනතේ විධිවිධාන අනුව කටයුතු කල යුතුය. |
| (ඇ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| | (i) මු.රෙ.110 | ගොවිජන සේවා කාරක සභා 13 ක් හානි හා පාඩු ලේඛණ පවත්වාගෙන නොතිබුණි. | ඉදිරියේදී සකස් කරන බව | මුදල් රෙගුලාසි විධි විධාන අනුව කටයුතු කල යුතුය. |
| | (ii) මු.රෙ.138(4), (6) සහ (8) | ගොවිජන සේවා කාරක සභා 02 ක වියදම් තහවුරු කිරීම සඳහා අදාළ ලේඛන සහ සාක්ෂි වවුචරය සමඟ ඉදිරිපත් කර නොතිබියදී එකතුව | මෙම වවුචර්පත් අදාල බිල්පත් හා උපලේඛන යොදා නිසි පරිදි සම්පූර්ණ කිරීමට කටයුතු | ගෙවීම් කිරීමට පෙර අදාල තහවුරු කිරීම් ලබාගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | රු.3,224,666 ක වවුචර්පත් 14 සඳහා ගෙවීම් කර තිබුණි. | කරන බව. | |
| (ඈ) | මුදල් රෙගුලාසි 880 හා 2020 ජුනි 25 දිනැති අංක 08/2020 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛය. | ගොවිජන සේවා කාරක සභා 08 ක අදාල නිලධාරීන් ඇප තැන්පත් කර නොතිබුණි | ඉදිරියේදී ඇප තැබීමට කටයුතු කරන බව | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කල යුතුය. |
| (ඉ) | 2014 අගෝස්තු 22 දිනැති අංක 07/2014 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛය | ගොවිජන සේවා කාරක සභා 05 ක දෛනිකව අත රඳවාගත හැකි සීමාව ඉක්මවා රු11,000 සිට රු.492,437 දක්වා පරාසයක අතැති මුදල් රඳවාගත් අවස්ථා 44 ක් පැවතුණි. | ඉදිරියේදී සීමාව ඉක්මවා කටයුතු නොකිරීමට අදාල නිලධාරීන්ට උපදෙස් ලබාදුන් බව. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කල යුතුය. |
| (ඊ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ගොවිජන සේවා කාරක සභා 14 ක ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන නොතිබුණි. | ඉදිරියේදී පවත්වා ගැනීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කල යුතුය. |
| (උ) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 හා 2009 ජුනි 17 දිනැති අංක 09/2009(1) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | ගොවිජන සේවා කාරක සභා 12 ක නිලධාරීන් කාර්යාලයට පැමිණීම හා පිටවීම සනාථ කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කර නොතිබුණි. | අලුත්වැඩියා කිරීමට යොමු කර ඇති බව | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කල යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

(අ) නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 18 ක සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලයේ, එකතුව රු.5,115,465 ක අතිරික්තයක් වූ අතර. ඊට අනුරූපී කාරක සභා 18 හි ඉකුත් වර්ෂයේ රු.6,257,619 ක අතිරික්තයක් විය. ඒ අනුව කාරක සභා 06 කට අදාල මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,888,716 ක වර්ධනයක් ද කාරක සභා 12 කට අදාල මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,030,870 ක පිරිහීමක්ද නිරීක්ෂණය විය. මෙම වර්ධනයන්ට මුළු ආදායමෙහි වැඩිවීම්, ආයතන හා පරිපාලන වියදම් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණු අතර, මූල්‍ය ප්‍රතිඵලයෙහි පිරිහීමට විකුණුම් ආදායම් අඩුවීම, අපහරණ වියදම් දැරීම හා පරිපාලන වියදම් වැඩිවීම හේතු වි තිබුණි.

(ආ) එසේම ගොවිජන සේවා කාරක සභා 02 ක සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලයේ එකතුව රු.115,124 ක ඌණතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව කාරක සභා 02 හි ඉකුත් වර්ෂයේ රු.519,841 ක අතිරික්තයක් විය. ඒ අනුව එම කාරක සභා දෙක ට අදාල මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.634,965 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට විකුණුම් ආදායම් අඩුවීම, තොග අපහරණ වියදම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචන

### 3.1 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 04 ක් විසින් ජංගම ගිණුම්වලට අදාල චෙක් පොත්වල හිස් චෙක්පත් 09 ක් අත්සන පමණක් යොදා කාර්යාලයේ රඳවා ගෙන තිබුණි. මේ හේතුවෙන් අක්‍රමිකතාවයක් සිදුවීමේ ඉඩකඩ බැහැර කළ නොහැකි විය. | චෙක්පත් අත්සන් කිරීමේ බලය ලබාදී ඇති නිලධාරින් පෞද්ගලික අවශ්‍යතාවයන් මත ප්‍රදේශයෙන් බැහැරව සිටි බැවින් චෙක්පත් අත්සන් යොදා ලබාගෙන තිබුණු බව. | මුදල් රෙගුලාසි විධිවිධාන අනුව කටයුතු කල යුතු අතර, හිස් චෙක්පත්වල අත්සන් නොකළ යුතුය. |

### 3.2 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නිල්දණ්ඩාහීන්න ගොවිජන සේවා කාරක සභාවේ සමාලෝචිත වර්ෂය තුල රු.132,471 ක යූරියා පොහොර කිලෝ ග්‍රෑම් 735.9 ක ඌනතාවය හා කඳපොල ගොවිජන සේවා කාරක සභාවේ සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් 15 දින රු.11,740 ක මුදල් සහ A4 බණ්ඩල 05 ක් අස්ථානගතවීම සම්බන්ධයෙන් මු.රෙ.104 අනුව අවශ්‍ය පරීක්ෂණ සිදුකර අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මේ සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන පරීක්ෂණයක් දිස්ත්‍රික් කාර්යාලයේ නිලධාරීන් විසින් සිදු කරමින් පවතින බව හා පොලිසියට පැමිණිලි කල බව. | වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන අලාභ අයකර ගත යුතුය. |

### 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 11 ක් පරිහරණය කරන ඉඩම් හා ගොඩනැගිලිවල අයිතිය පවරගෙන නොතිබුණි. | පවරා ගැනීම් සිදු කර ගැනීමට ඉදිරියේදි කටයුතු කරන බව | වත්කම්වල අයිතිය පවරාගත යුතුය. |
| (ආ) | මන්දාරම්නුවර ගොවිජන සේවා කාරක සභාවට අයත් මන්දාරම්නුවර නගරය ආසන්නයේ පවතින වර්ග අඩි 250 ක පමණ වන ගොඩනැගිල්ල බාහිර පාර්ශවයක් විසින් අනවසරයෙන් අත්පත් කර ගෙන තිබුණි. | බදු අයිතිය ලබාගත් පසු නීති මාර්ගයෙන් කටයුතු සිදු කිරීම සුදුසු බවට කාරක සභාව තීරණය කර ඇති බව. | වත්කම්වල අයිතිය තහවුරු කරගත යුතුය. |
| (ඇ) | නුවරඑළිය ගොවිජන සේවා කාරක සභාව භාවිතා කරන නුවරඑළිය මධ්‍යම වෙළඳ සංකීර්ණයේ කඩ කාමර දෙකක් සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු වරිපනම් බදු රු.316,584 ක් නිරවුල් කර නොතිබුණි. | මෙම කඩ කාමර 02 ක සඳහා වරිපනම් නොගෙවීම හේතුවෙන් රු.316,584 ක හිඟ මුදලක් නුවරඑළිය මහ නගර සභාවට ගෙවීමට ඇති බව. | ගෙවිය යුතු මුදල් ගෙවීමට කටයුතු කල යුතුය. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 03 ක 2017 හා 2020 අතර කාලය තුල ගොවින්ට අලෙවි කිරීමට මිලදීගත් රු.197,543 ක කල් ඉකුත්වූ කෘෂි බීජ හා කෘෂි රසායන තොගයක් විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | අපහරණය සඳහා අනුමැතිය ලබාගැනීමටත් කටයුතු කරන බව. | කල් ඉකුත් වු තොග පරීක්ෂාවකින් පසුව අපහරණය කල යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 12 ක විකුණා මුදල් ගෙවීමේ පදනම යටතේ කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරින් 127 දෙනෙකුට ලබාදුන් ණය වලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.7,219,758 ක් අයකර ගෙන නොතිබුණි. | අදාල නිලධාරීන් දැනුවත් කර ඇති බව. | සියළු ණය අයකර ගත යුතුය. |
| (ඇ) | ගොවිජන සේවා කාරක සභා 02 ක 2022/23 මහ කන්නය හා බඩ ඉරිඟු වගාව සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.29,933,000 ක යූරියා පොහොර කිලෝ ග්‍රෑම් 159500 ක් ලබාගෙන තිබුණු අතර අවශ්‍යතාවය හඳුනා ගෙන මිලදී නොගැනීම හේතුවෙන් විගණන දිනය වු 2023 ජුලි 25 දින වන විට තොග පොත් අනුව රු.14,873,700 ක යූරියා පොහොර කිලෝ ග්‍රෑම් 69331 ක් ඉතිරිව පැවතුණි. | අපේක්ෂිත ප්‍රමාණයෙන් කුඹුරු වගා නොකිරීම හේතුවෙන් යූරියා පොහොර ඉතිරිව ඇති බව. | අවශ්‍යතාවය සොයා බලා තොග මිලදී ගැනිම සිදුකල යුතුය. |
| (ඈ) | ගොවිජන සේවා කාරක සභා 16 ක 2018 දෙසැම්බර් 31 දිනැති අංක 07/05/12/ගි.වා/තා.ගො දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ ලිපිය අනුව කටයුතු කර දිර්ඝ කාලයක සිට පැවත එන එකතුව රු.11,162,746 ක වත්කම් ශේෂ 104 ක් සහ එකතුව රු.11,312,746 ක බැරකම් ශේෂ 103 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි. | නිරාකරණයට කටයුතු කරමින් පවතින බව. | කළමනාකරණ උපදෙස් අනුව කටයුතු කල යුතුය. |
| (ඉ) | මුංවත්ත ගොවිජන සේවා කාරක සභාවේ ඉකුත් වර්ෂයේ රු.135,872 ක් වැයකර නිෂ්පාදනය කරන ලද කාබනික පොහොර කි.ග්‍රෑම් 3480 (මිටි 58) ක පමණ තොගයක් වගා කටයුතු සඳහා ගොවීන් වෙත බෙදා හැරීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි. | කාබනික පොහොර මධ්‍යස්ථානයේ නිෂ්පාදනය කර අලෙවි කිරීමට කටයුතු කළද, ගොවීන් වෙත සහනාධාර ක්‍රමය යටතේ නොමිලේ කාබනික පොහොර නිකුත් කිරීමෙන් එහි ප්‍රමිතිය සම්බන්ධයෙන් විවිධ ගැටලු ඇති වු බැවින් මධ්‍යස්ථානයේ නිෂ්පාදිත කාබනික පොහොරද ගොවින් මිලදී ගැනීම අඩු වු බව. | අදාල ප්‍රමිතියට අනුකූල කාබනික පොහොර නිෂ්පාදනය කර ගොවීන්ට නිකුත් කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | ගොවිජන සේවා කාරක සභා 02 ක 2021 යල කන්නයේ ගොවීන් වෙත නොමිලයේ බෙදා හැරීම් සඳහා ලැබී තිබුණු MOP පොහොර කිලෝ ග්‍රෑම් 2294.95 ක තොගයක්, TSP පොහොර කිලෝ ග්‍රෑම් 1159.55 ක් හා ලීටර් 01 සහ මිලිමීටර් 500 ECO Vito කාබනික දියර පොහොර බෝතල් 794 ක් ගොවීන් වෙත බෙදා හැරීමෙන් තොරව නිශ්කාර්යව පවතින බව නිරීක්ෂණය විය. | සහකාර කොමසාරිස් දැනුවත් කර ඇති බව | අදාල කාලය තුල විධිමත්ව ගොවින්ට නිකුත් කල යුතුය |

**3.5 දූෂ්‍ය අක්‍රමිකතා**

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | නුවරඑළිය ගොවිජන සේවා කාරක සභාවේ හා ගොවිජන බැංකුවේ පහත මූල්‍ය අක්‍රමිකතා සිදුව තිබුණි. | | |
| (i) | ගොවිජන බැංකුවට අයත් රු.2,213,000 කට ආසන්න මුදලක් අයථා පරිහරණය කිරීම, කූඨ ලේඛණ සකස් කිරීම සහ අධිකාරි බලය ඉක්මවා ගෙවීම් සිදු කිරීම යන චෝදනා හේතුවෙන් 2021 ජනවාරි 12 දින සිට ගොවි බැංකුවට අනුයුක්ත කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාරවරයාගේ වැඩ තහනම් කර තිබුණි. නමුත් මේ සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් මුදල් රෙගුලාසි 104 අනුව පරීක්ෂණයක් සිදුකර වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. මුදල් රෙගුලාසි 119 හි සඳහන් විධිවිධානයන්ට පටහැනිව දිස්ත්‍රික් කාර්යාලය මඟින් 2017 ජූලි මස සිට එම නිලධාරියාගේ මාසික වැටුපෙන් රු.28,000 බැඟින් රු.286,000 ක් අයකර ගෙන තිබුණ අතර, එම මුදල ගොවිජන බැංකුවට ලබාදිය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි. එමෙන්ම අයථා ලෙස පරිහරණය කරන ලද මුදල ලෙස හඳුනාගෙන තිබුණු රු.2,213,000 ක් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | දෙපාර්තමේන්තු උපදෙස් ලබාගෙන කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කල යුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මධ්‍යස්ථානය සතුව පැවති රු.173,484 ක පොහොර, කෘෂි උපකරණ, ප්ලාස්ටික් කූඩ 20 ක් සහ බිම් තරාදියක් අස්ථානගත වී තිබුණ ද මේ සම්බන්ධව මු.රෙ.104 පරික්ෂණයක් සිදුකර වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| (iii) ගොවිජන සේවා කාරක සභාව සතුව තිබුණ උප පත්‍රිකා පොත් 03 ක් 2021 ජූනි මස 14 දින අස්ථානගතවී ඇති බවට මධ්‍යස්ථාන කළමනාකරණ සහකාර නිලධාරිනිය විසින් 2021 ජූනි 17 දින ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් වෙත දැනුම් දී තිබුණු අතර අස්ථානගතවූ රිසිට් පොත් මගින් එකතු කර තිබුණ මුදල රු.1,437,903 ක් විය. මේ සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මේ සම්බන්ධව දිස්ත්‍රික් කාර්යාල මගින් පරීක්ෂණයක් සිදු කරන අතර, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත මේ වන විට මෙම කුවිතාන්සි පොත් අස්ථාන ගත වීම සම්බන්ධව දැනුම් දී ඇති බව. | විධිමත් පරීක්ෂණයක් කඩිනමින් සිදු කල යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මල්දෙණිය ගොවිජන සේවා කාරක සභාවේ සේවය කරන ලද ගොවිජන සංවර්ධන නිලධාරියෙකුගෙන් 1999 වර්ෂයේ සිට 2004 දක්වා කාල පරාසයකට අදාළව තොග ඌණතා හා විවිධ අක්‍රමිකතාවලට අදාලව අයවිය යුතු රු.108,793 ක් අයකර ගෙන නොතිබුණි. | මෙම ශේෂය අයකර ගැනීම සම්බන්ධයෙන් සහකාර කොමසාරිස්ගේ උපදෙස් ලබාගෙන කටයුතු කරන බව. | අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

## 3.6 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ගොවිජන සේවා කාරක සභා 02 ක කාබනික පොහොර නිෂ්පාදනය සඳහා රු.165,000 ක් ගෙවා 2021 ඔක්තෝබර් 09 දින මිලදීගෙන තිබුණු “ගොවි මිතුරා” නැමැති යන්ත්‍රය හා ඉකුත් වර්ෂයේදි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලැබි තිබුනු මල්ටි චෝපර් යන්ත්‍රයක් භාවිතයට ගැනීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි. | කාබනික පොහොර නිෂ්පාදනය නොකරන බැවින් භාවිතයට නොගත් බව | යන්ත්‍ර අරමුණුගත කාර්යයට යොදවා ගත යුතුය. |
| (ආ) අනුමත ඇස්තමේන්තුවක් හා සැලැස්මක් නොමැතිව හා විධිමත් ගිවිසුමකින් තොරව රු.162,700 ක් වැයකර ඉදිකිරීම් සිදුකර වර්ෂ 03 ක් පමණ ගතවී ඇති රුපහ ගොවිජන සේවා කාරක සභා භූමියේ ඉදිකිරීම් ආරම්භ කර අඩක් නිමකර අතහැර දමා තිබුණු වැසිකිළිය නිෂ්කාර්යයව පැවතුණි. | අඩුපාඩු සම්බන්ධයෙන් දිස්ත්‍රික් කාර්යාලය දැනුවත් කර ඇති බව හා මෙතෙක් ඇස්තමේන්තු සකසා නොමැති බව. | විධිමත් ක්‍රමවේදයකට ඉදිකිරීම් සිදු කල යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

**මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1981 ඔක්තෝබර් 16 දිනැති අංක 107 දරන ගොවිජන සේවා කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 30 ඡේදයේ 3 වන වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයට අදාලව මූල්‍ය ප්‍රකාශන ගොවිජන සේවා කාරක සභා දෙකක් විගණනය සඳහා ඉදිරිපත් නොකල අතර, කාරක සභා 13 ක් නියමිත දිනය ඉක්මවා මාස 01 ත් 02 ත් අතර කාලයක් ප්‍රමාද වී ඉදිරිපත් කර තිබුණි. | ඉදිරි ගිණුම් වර්ෂවලදි නියමිත දිනට ඉදිරිපත් කිරිමට කටයුතු කරන බව | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කල යුතුය. |

## 5. ගොවිජන බැංකු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2012 පෙබරවාරි 29 දිනැති අංක 04/2012 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛයේ 4.3 වගන්තියට අනුකූල නොවන ලෙස දෛනිකව අත රඳවා ගත හැකි රු.10,000 සීමාව ඉක්මවා ගොවිජන සේවා කාරක සභා 05 ක අවස්ථා 66 කදී රු.13,092 සිට රු.631,303 දක්වා මුදල් අත රඳවා ගෙන තිබුණි. | ඉදිරියේදි සීමාව නොඉක්මවීමට අදාල නිලධාරීන් දැනුවත් කල බව | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කල යුතුය |
| (ආ) | 2012 පෙබරවාරි 29 දිනැති අංක 04/2012 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛයේ 3.4.2 ඡේදය අනුව කෘෂි කාර්මික ණය පියවීමේ උපරිම කාලය මාස 06 ක් වුවද, ගොවිජන සේවා කාරක සභා 16 ක ගොවීන් 2,532 දෙනෙකු විසින් ලබාගත් රු.42,268,356 ක කෘෂි ණය අයකර නොතිබුණි. | අයකර ගැනිමට කටයුතු කරන බව | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කල යුතුය |
| (ඇ) | 2012 පෙබරවාරි 24 දිනැති අංක 04/2012 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛයේ 4.4.4 වගන්තිය අනුව ගොවිජන බැංකුවක ඇති අතිරික්ත මුදල් පොලී ආදායමක් ලැබෙන පරිදි ආයෝජනය කල යුතු බව දන්වා තිබුණද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගොවිජන බැංකු 04 ක ඉතිරි කිරීමේ ගිණුම්වල රු.1,523,506 සිට රු.4,877,422 දක්වා ශේෂ පැවතියද, ඉහළ මූලය ප්‍රතිලාභයක් ලබාගත හැකි ඵලදායි ක්ෂේත්‍රයක ආයෝජනය කර නොතිබුණි. | ඉදිරියේදි අවශ්‍ය කටයුතු සිදු කරන බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කල යුතුය |

| | | | |
|---|---|---|---|
| (ඈ) | ගොවිජන සේවා කාරක සභා 05 ක ගොවීන් 147 දෙනෙකුට ලබාදී තිබුණු රුපියල් ලක්ෂයේ ණය සහ කෘෂි උපකරණ ණය එකතුව රු.6,667,803 ක් හා ගොවිජන කාරක සභා 07 ක ගොවිජන විනිශ්චය සභා වෙත යොමුකල ගොවීන් 122 දෙනෙකුගෙන් අයවිය යුතු ණය රු.1,941,839 ක් අයකර නොතිබුණි. | ගොවිජන විනිශ්චය සභාවට යොමු කර අයකිරීමට කටයුතු කරන බව. | සියළු ණය අයකර ගත යුතුය |
| (ඉ) | මුදල් රෙගුලාසි 395 (ඇ) අනුව ගොවිජන සේවා කාරක සභා 03 ක සමාලෝචිත වර්ෂය සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි. | ඉදිරියේදී සකස් කරන බව | මුදල් රෙගුලාසි විධි විධාන අනුව කටයුතු කල යුතුය. |
| (ඊ) | මුදල් රෙගුලාසි 386 විධි විධානවලට අනුකූල නොවන ලෙස සභාපතිවරයා විසින් අත්සන් කරන ලද හිස් චෙක්පත් දෙකක් පල්ලේබෝවල ගොවිජන බැංකුව භාර නිලධාරියා සතුව පැවැතිණි. | නැවත එලෙස නොකරන බව. | හිස් චෙක්පත් අත්සන් නොකල යුතුය. |
| (උ) | බුළුගහපිටිය ගොවිජන සේවා කාරක සභාවේ ගොවිජන බැංකුව මඟින් කොම්පෝස්ට් ව්‍යාපෘතියක් සඳහා 2017 ඔක්තෝබර් 20 දින පුද්ගලයකු වෙත ලබාදී තිබුණු රු.500,000 ක සාර ලංකා ණය මුදලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට රු.497,281 ක් අයකර ගෙන නොතිබුණි. | නිතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා කටයුතු කර ඇති බව. | නියමිත කාලය තුල අයකර ගැනිමට කටයුතු කල යුතුය. |
| (ඌ) | විදුලිපුර ගොවිජන සේවා කාරක සභාවේ විධායක ලේකම් හෝ අදාල වගකිව යුතු නිලධාරියකු විසින් ණය ඉල්ලුම්පත් අනුමත කිරීමකින් සහ නිර්දේශ කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂයේදී ණය වර්ග 03 කට අදාලව පුද්ගලයින් 87 දෙනෙකුට රු.4,241,000 ක ණය නිකුත් කර තිබුණි. | ණය ඉල්ලුම් පත් අනුමත කොට නිර්දේශ කොට අඩුපාඩු සකස් කර ඇති බව | ණය ලබාදිමට ප්‍රථම අදාල ලේඛන සම්පූර්ණ කල යුතුය |